# අභයගිරිය කෞතුකාගාරය ආශ්‍රිත සංචාරක ආකර්ෂිතයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පී.ආර්.ඒ.එස්. හපුගොල්ල
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ashinisachinthana99@gmail.com

**මුඛ්‍ය පද** - අභයගිරිය, කෞතුකාගාරය, ප්‍රවර්ධනය, සංචාරක, ශ්‍රී ලංකාව

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අභයගිරි ව්‍යාපෘතිය යටතේ ඇති අභයගිරි කෞතුකාගාරය 1992 මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් චීන සමූහාණ්ඩුවේ ධන පරිත්‍යාගයෙන් ඉදිකොට ඇත. අභයගිරි මහා විහාරයේ ආරම්භක සංඝනායක කුපික්කල මහාතිස්ස භික්ෂූන් වහන්සේ හා අභයගිරි විහාරයේ වැඩ විසූ ෆාහියන් භික්ෂූන් වහන්සේ අනුස්මරණය කිරීම සඳහා මහාතිස්ස ෆාහියන් සංකීර්ණය ලෙස ද මෙම කෞතුකාගාරය හැඳින්වේ. අතීතයේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තරව පැවති සබඳතාවන්හි සාධක අභයගිරියෙන් හමු වූ කෞතුක වස්තු තුළින් පැහැදිලි වේ. ලෝකඩ තාක්ෂණය, අක්ෂර කලාව, පුරාණ වාස්තු විද්‍යාව, සියුම් කලා තාක්ෂණය, සනීපාරක්ෂාව, ජල කළමනාකරණය, විහාර පරිපාලනය, කාල කළමනාකරණය පිළිබඳ තොරතුරු සම්බන්ධ කෞතුක වස්තු එකතුවක් අභයගිරි කෞතුකාගාරය තුළ ප්‍රදර්ශනයට තබා ඇත. දැනුදු මෙම කෞතුකාගාරය සංචාරක ආකර්ෂණයට ලක් වූ ස්ථානයක් ලෙස හඳුනා ගත හැක. ප්‍රදර්ශන මැදිරි සකස් කිරීමේ දී කෞතුක වස්තු වර්ගීකරණය පිළිබඳ සැලකිලිමත් වීම, වාස්තුවිද්‍යානුකූලව එහි පවත්නා වූ සැලසුම් සහගත බව, පිහිටි පරිසරය ආදී හේතු නිසාවෙන් ද සංචාරක ආකර්ෂණය ලබාගෙන ඇත. අභයගිරිය කෞතුකාගාරය සංචාරක ආකර්ශිතයක් කළ හැකිද? ඊට පවත්නා වූ ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජනයන් මොනවාද යන්න පර්යේෂණ ගැටලුව ලෙස යොදාගෙන ඇත. එමෙන්ම පර්යේෂණ අරමුණ වර්තමානයේ අභයගිරිය කෞතුකාගාරය තුළ පවත්නා වූ ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජනයන් හඳුනා ගනිමින් සංචාරක ආකර්ෂිතයන් ප්‍රවර්ධනය කිරීම වේ.

## ක්‍රමවේදය

ක්ෂේත්‍ර විමර්ශනයක් ඔස්සේ අභයගිරිය කෞතුකාගාරයේ වර්තමාන තත්ත්වය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලද අතර, ඉන් අනතුරුව සාහිත්‍යය මූලාශ්‍රගත තොරතුරු එක්රැස් කරන ලදි. තවද සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත අත්පත් කර ගැනීමට කටයුතු කරන ලදි. එම දත්ත විශ්ලේෂණයෙන් ලද ප්‍රතිඵල පහත පරිදි පෙන්වා දෙනු ලබයි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

සංචාරක ආකර්ෂිතයන් ආශ්‍රිත උරුමයන් ප්‍රවර්ධනය කිරීමේ දී පවත්නා වූ උරුමය ජනතාව හා සමීප කිරීම සිදු කළ යුතු වේ. පවත්නා වූ උරුමය සංචාරක ආකර්ෂණය හමුවේ ප්‍රවර්ධනය කිරිමේ දී එය ඵලදායි ලෙස සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. මෙම කෞතුකාගාරය අධ්‍යනයයේ දී එය සතු ශක්තීන් හා අවස්ථා හඳුනා ගැනීමට හැකි වේ. සංචාරක ආකර්ෂිතයක් ලෙස මෙම කෞතුකාගාරය සතු ශක්තීන් රැසක් වන අතර, ඒ අනුව අන්තර්ජාලය මඟින් ප්‍රවේශපත්‍ර වෙන් කර ගැනීමේ හැකියාව ද පවතී. අවශ්‍ය වූ විට සංචාරකයා සිටින ඕනෑම ස්ථානයක සිට ප්‍රවේශපත්‍ර වෙන් කර ගැනීමේ හැකියාව පවතී. ලංකාවේ අනෙකුත් කෞතුකාගාරයන් හි මෙන් නොව මෙම කෞතුකාගාරය තුළ දැන්වීම් පුවරු හා වෙබ් පිටුව නිර්මාණය කිරීමේ දී සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම ප්‍රදර්ශනය කිරීම සිදු කොට ඇත. අභයගිරිය කෞතුකාගාරයට ඇතුල් වීමට පෙර අවස්ථාවේ දී පිළිගැනීමේ නිලධාරීන් විසින් සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් මුද්‍රණය කරන

ලද අත් පත්‍රිකා ලබා දීම සිදු කෙරේ. ප්‍රකාශන හා අනුරූ වෙළඳසැලක් පවතින අතර, මධ්‍යම සංස්කෘතික අරමුදලේ සියලුම ප්‍රකාශන සඳහා වට්ටම් ලබාදීම ද සිදු කරයි.

අභයගිරිය කෞතුකාගාරය සැලසුම් සහගත ලෙස ස්වභාවික පිහිටි පරිසරයක අතීත පංචාවාසයක් මනඃකල්පිත ආකාරයට නිර්මාණය කොට ඇත. මේ නිසාවෙන් සංචාරක ආකර්ෂණය නොමඳව ලැබේ. මෙවැනි ශක්තීන් රැසක් මෙන්ම විවිධ අවස්ථාවන් ද සමඟින් අභයගිරිය එම පවත්නා ගැටලු හා අභියෝගයන්ට විසඳුම් දැක්වීමේ දි ඒවා කාලෝචිත අයුරින් සිදු කිරිමෙන් උරුමය ප්‍රවර්ධනය කිරිම සිදු කර ගත හැක. එහි දී කෞතුකාගාරය සතු උරුම ප්‍රවර්ධනය කිරීමට පාඨමාලා, දේශන පැවැත්වීම සිදු කළ හැක. එමඟින් කෞතුක වස්තු පිළිබඳ සංචාරකයාට දැනුමක් ලැබා ගැනීමට හැකි වේ. ප්‍රේක්ෂක ක්‍රියාකාරකම් සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරිම සිදු කළ යුතු වේ. කෞතුකාගාරය නැරඹීමෙන් සංචාරකයින් සඳහා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් කෞතුක වස්තු නිර්මාණය කිරිමේ වැඩසටහන්, නාට්‍ය, ගීත යනාදි වූ ක්‍රියාකාරකම් සිදු කිරිමට අවස්ථාව ලබා දිය හැක.

මෙම කෞතුකාගාරය තුළ පුස්තකාලයක් නොමැති අතර සංචාරකයින්ට ස්වයං අධ්‍යයනයන් හි නිරත වීමට හැකියාව නොමැත. දුරස්ථ හා අඛණ්ඩ සේවාවන් ලෝකයේ ඕනෑම ස්ථානයක ඇති කෞතුකාගාර සතු වේ. වර්තමානයේ මෙම කෞතුකාගාරය මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් පාලනය වන අතර නඩත්තු කටයුතු හා අනෙකුත් කාර්යයන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අභයගිරිය ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලැබේ. මෙය කෞතුකාගාරය සතු අවස්ථාවන් වන අතර, එමඟින් මෙය සක්‍රීය කෞතුකාගාරයක් ලෙස පවත්වා ගෙන යාමට හැකි වී ඇත. E Ticket මඟින් සංචාරකයින් හට ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීමේ පහසුව නිසාවෙන් විශාල ප්‍රවේශ පත්‍ර ප්‍රමාණයක් විකිණීමට හැකි වීම එහි සතු අවස්ථාවක් වේ. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්ත්වයෙන් දැන්වීම් පුවරු හා වෙබ් පිටුව සකසා තිබීම නිසාවෙන් අභයගිරිය කෞතුකාගාරය සතු කෞතුක වස්තුන්හි ප්‍රදර්ශනය වන්නා වූ සංස්කෘතිකමය, පුරාවිද්‍යාත්මක, ආගමික, තාක්ෂණික, සමාජීය වටිනාකම් සංචාරකයාට පහසුවෙන් ලබා දීමේ අවස්ථාව පවතී.

මෙකී කෞතුකාගාරය සතු එකතුන් ක්‍රමානුකූල වර්ගීකරණයන්ට අනුව බෙදා දක්වා ඇති අතර, එය සංචාරකයාගේ අවශ්‍යතාවය පරිදි සුවිශේෂි වූ අවස්ථාවක් වේ. ශ්‍රව්‍යය දෘශ්‍යය ඒකකයක් පවතින අතර සංචාරකයින් සඳහා අධ්‍යාපනික දැනුවත් කිරීම්, වීඩියෝපට නැරඹීමේ අවස්ථාවන් පවතී. කෞතුකාගාරය සතු ශක්තීන් හා අවස්ථාවන් නිසාවෙන් සංචාරක ආකර්ෂණයක් පැවතිය ද එහි පවත්නා වූ දුර්වලතා හා තර්ජනයන් නිසාවෙන් සංචාරක ආකර්ෂිතයක් ලෙස ප්‍රවර්ධනය කිරීම වර්තමානය වන විට ගැටලු සහගත වී ඇත. එකී දුර්වලතා හා තර්ජනයන් නිසාවෙන් සංචාරකයින් සඳහා කෞතුකාගාරය සතු උරුමය ප්‍රවර්ධනය කිරීම ද අපහසු වේ. දැනුදු මෙකී කෞතුකාගාරය සතු දුර්වලතාවයන් ලෙස සංචාරක ආකර්ශිතයන් ප්‍රවර්ධනය කිරීමට පාඨමාලා, දේශන පැවැත්වීම සිදු කළ හැක. එමඟින් කෞතුක වස්තු පිළිබද සංචාරකයාට දැනුමක් ලබා ගත හැක. කෞතුකාගාරය සතුව පුස්තකාලයක් නොමැති අතර සංචාරකයින්ට ස්වයං අධ්‍යයනයන්හි නිරත වීමේ හැකියාව නොපවතී. වර්තමානයේ දී අභයගිරිය කෞතුකාගාරය තුළ නඩත්තු කටයුතුවල යම් අවිධිමත්භාවයක් දැකිය හැක. විදුලි පහන් හා කැමරා කැඩී ගොස් තිබේ. කෞතුක වස්තුන්හි මකුළු දැල් සෑදී ඇත. දුරස්ථ හා අඛණ්ඩ සේවාවන් මඟින් ලෝකයේ ඕනෑම ස්ථානයක සිට දැනගැනීමේ හැකියාව පවතින අතර, අභයගිරිය කෞතුකාගාරයේ වෙබ් අඩවිය මඟින් ජංගම ප්‍රදර්ශන, වැඩසටහන් ආදිය පිළිබඳව තොරතුරු යාවත්කාලීන කිරීමක් සිදු නොකෙරේ. ත්‍රිමාණ තාක්ෂණය යොදාගනිමින් කෞතුකාගාරය සතු කෞතුක වස්තු වෙබ් අඩවිය මඟින් ප්‍රදර්ශනය කිරීමේ හැකියාව පවතින අතර, එමඟින් සංචාරකයා තුළ කුතුහලය ගොඩනැගිය හැක. පුවත් අංශයක් කෞතුකාගාරය තුළ ස්ථාපිත කොට නොමැති අතර,

දේශීය මෙන්ම විදේශීය සංචාරක ප්‍රජාවට කෞතුකාගාරය පිළිබඳ පුවත් සම්බන්ධව දැනුවත් වීමේ හැකියාවක් නොමැත. මෙම පුවත් කෞතුකාගාර වෙබ් අඩවිය මඟින් පලකිරීමේ හැකියාව ඇත. ප්‍රේක්ෂක ක්‍රියාකාරකම් සඳහා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, නාට්‍ය ගීත යනාදී වූ ක්‍රියාකාරකම් සිදු කිරීමට අවස්ථාවන් ලබා දිය යුතු වේ. කෞතුකාගාරය සතු දුර්වලතා හේතුවෙන් සංචාරක ආකර්ෂිතයන් ප්‍රවර්ධනය සඳහා තර්ජනයන් හට ගනියි.

අභයගිරිය කෞතුකාගාරය තුළ පවත්නා වූ තර්ජනයන් ලෙස කෞතුකාගාරය පිළිබඳව සංචාරකයින් දැනුවත් නොවීම හඳුනාගත හැක. බොහෝ සංචාරකයින් අනුරාධපුර පූජා නගරයේ ප්‍රසිද්ධ ස්ථාන කිහිපයක් පමණක් නරඹන අතර, අභයගිරිය කෞතුකාගාරය පිළිබඳව දැනුවත් භාවයෙන් තොර වේ. අවිධිමත් නඩත්තු ක්‍රියාවලීන් නිසාවෙන් සංචාරකයා තුළ අපැහැදිලිභාවයක් කෞතුකාගාරය පිළිබඳව ඇති විය හැක. වෙබ් අඩවිය යාවත්කාලීන නොකිරීම, වැඩසටහන් පිළිබඳව දැනුවත් නොකිරීම්, පුස්තකාල පහසුකම් සැපයීමේ නොහැකියාව ආදිය නිසාවෙන් ආකර්ෂිතයන් ප්‍රවර්ධනය කිරීමේ දී සංචාරකයාට තොරතුරු ලබා ගැනීමේ තර්ජනයන් ඇති විය හැක. පිළිගැනීමේ හා තොරතුරු දැනගැනීමේ කවුළුව ආකර්ෂණීය ලෙස සකස් නොකිරීම නිසාවෙන් සංචාරකයා ඇතුළු වීමේ දී ම ඔහු තුළ කෞතුකාගාරය පිළිබඳ අපැහැදිලිභාවයක් ගොඩ නැගෙන අතර, ප්‍රධාන වශයෙන් කාර්යය මණ්ඩලය සංචාරකයින් සමඟ මනා සබදතාවයක් පවත්වා නොගැනීම ද මෙම කෞතුකාගාරය තුළ පවත්නා වූ තර්ජනයක් වේ. සංචාරක ආකර්ෂිතයන් ප්‍රවර්ධනය සඳහා විසඳුම් වශයෙන් කෞතුකාගාරය තුළ අතත්‍ය ඡායාරූප, වීඩියෝපට වෙබ් අඩවියේ පළකිරීම, අතත්‍ය චාරිකා සංවිධානය කිරීම, ත්‍රිමාන තාක්ෂණය යොදා ගැනීම, දුරස්ථ හා අඛණ්ඩ සේවා ලබා දීම, සංචාරක ක්‍රියාකාරකම් සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම, අනුරූ නිර්මාණයන් කිරීම සඳහා සුදුසු වෙළඳපොළක් සැකසීම, සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම, සංචාරකයින් සමඟ යහපත් සබඳතා පවත්වා ගැනීම, නිසි නඩත්තු කටයුතු කිරීම යනාදී වූ කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.

අභයගිරිය කෞතුකාගාරය සතු අනන්‍යතාවය පවත්වා ගනිමින් සංචාරක ආකර්ෂිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පවත්නා වූ දුර්වලතා හා තර්ජනයන් හඳුනා ගනිමින් අවශ්‍යය ක්‍රියාමාර්ගවලට එළැඹීමෙන් සංචාරක ආකර්ෂණය ලබා ගත හැකි බව සමාලෝචනය කළ හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**

Dalak.J. (2022). ***Museology and its Theory***, Technical Museum in Brno, Brno.

Kapukotuwa, A. (2018). ***Exhibition Methods of Museum Objects***, Saman Publisher, Nugegoda.